

# ආර්ථික වර්ධන වේගය 3.2කට බැහැලා

මහ බැංකුවේ 2018 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඉකුත් බ්‍රහස්පතින්දා නිකුත් විය. ඒ අනුව 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 35 වැනි වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ 69 වැනි වාර්ෂික වාර්තාව මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා වෙත එදින පිළිගන්වන ලදී. වෙනදා නම් ඉන් පසු කරන්නේ මාධ්‍ය හමුවක් පවත්වා එම වාර්තාවේ පිටපත් මාධ්‍යවේදීන්ට ලබා දීමයි. මහජනයා වෙනුවෙන් මේ තොරතුරු සමාජගත කරන්නේ මාධ්‍යවේදීන්ය. ඒ නිසා ඇත්ත වශයෙන්ම මේ වාර්තාව මාධ්‍යවේදීන්ට ලබාදීමේ අර්ථය නම් මහ බැංකු වාර්තාවේ තොරතුරු සමාජගත කිරීමයි. පොදු මහජනතාව අතට පත් කිරීමයි. මෙවර එවැන්නක් සිදු නොවූ අතර මුදල් ඇමැති මංගල සමරවීර මහතාට එය පිළිගැන්වීමෙන් පසු මහ බැංකුව කළේ එසේ මහ බැංකු වාර්තාව මුදල් ඇමැතිවරයාට පිළිගන්වන පින්තූරයක් සමග පිටු කිහිපයකින් එහි සාරාංශයක් මාධ්‍යවේදීන් වෙත ඊමේල් කිරීමයි. ගිය වසරේ නම් අප්‍රේල් 26 වැනිදා මහ බැංකුව සිය වාර්තාව මාධ්‍ය හමුවක්ද පවත්වා මධ්‍යවේදීන් වෙත ලබා දීම සිදු විය. මේ වසරේ එය නොකළේ පසුගිය 21 වැනිදා සිදු වූ ත්‍රස්ත ප්‍රහාර නිසා ආරක්ෂක පියවරක් ලෙස දැයි පැහැදිලි නැත. කෙසේ වෙතත් නව මහ බැංකු වාර්තාව මේ වන විට මහ බැංකු වෙබ් අඩවියට ඇතුළත් කර තිබේ. එමගින් රටේ ජනතාවගෙන් ගමේ ගොඩේ ජේම්ස් අයියලාට කෙසේ වෙතත් අන්තර්ජාල පහසුකම් තිබෙන අවශ්‍ය අයට එය පරිශීලනය කිරීමට

කරන ලදී. සේවා අංශයේ ක්‍රියාකාරකම්වල සිදු වූ සියයට 4.7 ක වර්ධනය සහ කෘෂිකාර්මික කටයුතු යථා තත්ත්වයට පත්වෙමින් එම අංශයේ වාර්තා කළ සියයට 4.8 ක වර්ධනය මේ සඳහා වැඩි දායකත්වයක් සපයන ලදී. ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් කටයුතුවල පසුබෑම හේතුකොටගෙන වසර තුළදී කර්මාන්ත අංශයේ වර්ධනය සියයට 0.9 ක් දක්වා සැලකිය යුතු ලෙස මන්දගාමී විය. ද.දේ.නි. ගණනය කිරීමේ වියදම් ප්‍රවේශය අනුව, පරිභෝජන වියදම් සහ ආයෝජන වියදම් යන දෙඅංශයම 2018 වර්ෂයේ ආර්ථික වර්ධනය සඳහා දායක විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආයෝජන පෙර වසරේ වාර්තා කළ සියයට 28.8 ට සාපේක්ෂව සියයට 28.6 ක් ලෙස පැවතුණු අතර ඉතුරුම් - ආයෝජන පරතරය වසර තුළදී තවදුරටත් පුළුල් වූයේ එහි හිඟය සපුරා ගැනීම සඳහා විදේශීය සම්පත් මත වූ රැඳියාව ඉහළ යෑම පිළිබිඹු කරමිනි. 2018 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය එ.ජ. ඩොලර් බිලියන 88.9

වී ඉතුරුම් - ආයෝජන පරතරය වසර තුළදී තවත් වැඩි වීමද සිදුව ඇත. එසේම සේවා වියුක්තිය ඉහළ ගොස් රටේ ශ්‍රම බළකායේ සහභාගිත්වයද පහළ ගොස් තිබේ. මේ කරුණු අනුව ආර්ථිකය 2018 වසරේදී තවත් නරක අතට හැරී ඇති බව පෙනෙන අතර වත්මන් ත්‍රස්ත ප්‍රහාරවල ආර්ථික බලපෑම් සමග මේ වසරේ (2019) ආර්ථික ක්‍රියාකාරීත්වයටද අහිතකර බලපෑම් ඇතිවීම වැළැක්විය නොහැකිය. මේ අනුව සිදු වනු ඇත්තේ අපේක්ෂිත ආර්ථික වර්ධනය තවත් අඩු වීමයි. ගිය වසරේ මහබැංකු වාර්තාව එළිදක්වමින් මහ බැංකු අධිපතිවරයා කීවේ අපේ විභව ආර්ථික වර්ධනය සියයට 5.75 ක් පමණ වන බවයි. එනම් අපට ලබාගත හැකිව තිබෙන ආර්ථික වර්ධනයයි. ඒ අනුව අපේ ආර්ථික වර්ධනයේ සත්‍ය අගය සහ ලබා ගත හැකිව තිබෙන අගය අතර සැලකිය යුතු පරතරයක් තිබේ. එහෙත් නිසි දැක්මක් හෝ වැඩපිළිවෙළක් නැති රාජ්‍ය ප්‍රතිපත්තිය නිසා

ආර්ථික ස්ථායීතාව පවත්වාගෙන යෑමට දැරූ ප්‍රයත්න මධ්‍යයේ වුවද, අත්‍යවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ප්‍රමාදවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය මන්දගාමී වර්ධන මාවතකට පත්ව ඇත. දශකයකට පමණ පෙර මැදි ආදායම් ලබන රටක මට්ටමට පත් වූ ශ්‍රී ලංකාවට 'මැදි ආදායම් උගුල' යන තත්ත්වයෙන් මිදී ඉහළ ආදායම් මට්ටමකට ළඟා වීම සඳහා දූරදර්ශී ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අවශ්‍ය විය. කෙසේ වුවද, ආර්ථික වර්ධනය සඳහා උපකාර වන ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට සමාන ආර්ථිකයන් පවතින රටවල් ශීඝ්‍ර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර, අපනයන ප්‍රවර්ධනය, විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය, අයවැය හිඟය හා ණය මට්ටම අඩු කර ගැනීම, සාධක වෙළඳපොළ ප්‍රතිසංස්කරණය, රාජ්‍ය පරිපාලනය ශක්තිමත් කිරීම සහ රටෙහි නීතිය නිසි පරිදි ක්‍රියාත්මක වීම සහතික කිරීම යන අංශවල වර්ධනය කෙරෙහි ඇති බාධා විසඳීමට හා ආර්ථික වර්ධනය දියුණු කිරීමේ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට ඇති ප්‍රමාදයන් ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය පහළ මට්ටමක පැවතීම සඳහා විශාල වශයෙන් හේතු වී ඇත. එම නිසා, ශ්‍රී ලංකාවට ඉහළ ආදායම් ලබන ආර්ථිකයක් ලෙස සාර්ථකත්වයට පත් වීමට සහ එහි පුරවැසියන්ගේ යහපැවැත්ම වැඩි දියුණු කර ගැනීම සඳහා, ආර්ථිකයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වේගවත් කිරීම තුළින් ආර්ථික වර්ධනය අඛණ්ඩ පහළ අගයක පැවතීමට හේතු වූ කරුණු සඳහා පිළියම් යෙදීම අත්‍යවශ්‍ය වේ.

නිසි කලට ස්ථාපිත කිරීම ඉන්දියන් සාගරයේ ආයෝජන සඳහා ඉහළ අවධානයක් ඇති ක්‍රමෝපායික පිහිටීමක් සහිත රටක් ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථික පෙර දැක්ම හා අපේක්ෂාවන් වැඩි දියුණු කිරීම සඳහා පමණක් නොව, රටේ ජනතාවගේ සමස්ත ජීවන තත්ත්වය සහ එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ද අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාව මැදිකාලීන ඉහළ හා ස්ථාවර වර්ධන මාවතක් ඔස්සේ ඉදිරියට යෑමට සහ දශක කිහිපයකට පෙර ශ්‍රී ලංකාවට පසුපසින් සිටි රටවල් සමඟ තරගකාරී වීමට නම්, මෙම ප්‍රතිසංස්කරණ තවදුරටත් කල් දැමීම සිදු කළ නොහැක.'

මහ බැංකුව මේ කියන දේවල් සත්‍ය වුවත් ඔය කියන සියලු ආර්ථික ප්‍රතිසංස්කරණ වලටත් වඩා වැදගත් වන්නේ රටේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම බව අප කාට කාටත් සිහිපත් කිරීමට සිදු වේ. එය නැත්නම් ආර්ථික ප්‍රගතියක් ඇති කර ගැනීමත් සිහිනයක් බව පැහැදිලිය. මේ අවස්ථාවේ අගරදගුරුතුමන් කළ ප්‍රකාශ ඉතාමත්ම අගය කළ යුතු වේ. උන්වහන්සේ කියන්නේ පලිගන්න කියා නොව සන්සුන්ව දුක දරා ගන්නා ලෙසයි. එය ඉතාම ආදර්ශමත්ය. එහෙත් මේවාට වගකිවයුත්තන්ට සහ ඊට වගකිවයුතු රටේ අන්තවාදී සංවිධානවලට නීතිය ද ක්‍රියාත්මක කර මෙවැනි සිදුවීම් නැවත නොවන ලෙස අවශ්‍ය පියවර ගැනීම ද අත්‍යවශම කාරණාවයි. එසේ නොකළහොත් මෙවැනි සිදුවීම් ඉදිරියේදීත් සිදු වීමට ඉඩ තිබේ. ඒ නිසා බුද්ධි අංශ ශක්තිමත් කර කෙලින්ම මෙවැනි ත්‍රස්ත ක්‍රියාවලට සම්බන්ධ බවට